සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

## I කොටස

(01) ක්‍රි. ව. පස්වන සියවසේ දී මහාවංශය රචනා කරන ලද්දේ, මහාවිහාරවාසී භික්ෂූන් වහන්සේ නමක් වූ .................................. විසින් ය.

(පාහියන් හිමි, මහානාම හිමි, මහානාග හිමි)

(02) ලෝකයේ ප්‍රථම වරට බිහි වූ ජීවයක් සහිත බැක්ටීරියාව .................................. නමින් හැඳින්වී ය.

(නෙබියුලා, ඔපබීනියා, ප්‍රොකායෝට්)

(03) ප්‍රථම වරට රබර් බෝලයක් නිපදවූයේ .................................. ශිෂ්ටාචාර වැසියන් ය.

(මෙසපොතේමියානු, ඊජිප්තු, මායා)

(04) ශ්‍රී ලංකාවේ ප්‍රථම චෛත්‍ය වූ ථූපාරාමයට වටදාගෙයක් ඉදි කළේ .................................. රජතුමා විසිනි.

(දේවානම්පියතිස්ස, වසභ, මහසෙන්)

(05) 'කම්මාරදේව' නැමැති දෙවියන් වෙනුවෙන් පණ්ඩුකාභය රජතුමා විසින් .................................. සිදු කරන ලදී.

(පෙරහැරක් පැවැත්වීම, ගමක් තෑගි දීම, දේවාලයක් ඉදිකිරීම)

අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදි නම් ✗ ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

(06) මානව පරිණාමයේ වැඩි කොටසක් සිදු වූයේ මහා හිම යුගය නම් වූ අධික ශීත කාලයේ ය. (    )

(07) කාලිබන්ගන් යනු ඊජිප්තු ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගරයකි. (    )

(08) අප්‍රිකානු ප්‍රදේශවල ජීවත් වන මිනිසුන් 'නිග්‍රොයිඩ්' මානව වර්ගයට අයත් ය. (    )

(09) රුවන්වැලි මහා සෑයේ වැඩ නිම කළේ දුටුගැමුණු රජතුමා විසිනි. (    )

(10) කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙන යාමට ඉදි කර තිබෙන ඇල මාර්ගය ''ජය ගඟ' යන නමින් ද හැඳින් වේ. (    )

ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.

(11) මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිතා කළ බවට සාධක හමු වී ඇත්තේ මින් කවර ස්ථානයකින් ද?

1. කැනඩාව
2. අප්‍රිකාව
3. ඊශ්‍රායලය
4. චීනය

(12) පුරාණ කාලයේ දාගැබක ආරක්ෂාව සඳහා ඉදි කරන ලද ගොඩනැගිල්ලක් හැඳින්වීමට යොදා ගත් නම වූයේ,

1. ආසනඝරය යි.
2. පධ්මාඝරය යි.
3. වටදාගෙය යි.
4. ධාතු මන්දිරයයි.

(13) අනුරාධගාම, පුරයක් බවට පත් කරමින් අනුරාධපුර රාජධානිය බිහි කළ රජතුමා මින් කවරෙක් ද?

1. පණ්ඩුකාභය රජු
2. දේවානම්පියතිස්ස රජු
3. මුටසීව රජු
4. දුටුගැමුණු රජු

(14) සංඝමිත්තා තෙරණින් වහන්සේ ශ්‍රී ලංකාවට ජය ශ්‍රී මහා බෝ සමිඳු රැගෙන වැඩිය වරාය වන්නේ මින් කුමක් ද?

1. මහාතිත්ථ වරාය යි.
2. දඹකොළ පටුන වරාය යි.
3. ගෝකණ්ණ වරාය යි.
4. ලංකා පටුන වරාය යි.

(15) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරනු ලැබුයේ,

1. අභයගිරි විහාරයේ ය.
2. මහා විහාරයේ ය.
3. මාතලේ අලු විහාරයේ ය.
4. ජේතවන විහාරයේ ය.

අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට අදාළ පිළිතුරු ලියන්න.

(16) ගොඩබිම පළමුවෙන් ම ශාක පැතිරී ගිය කාලය ........................................ යුගය නමින් හැඳින් වේ.

(17) ගිණිකොණ හා නැගෙනහිර ආසියානු රටවල ජීවත් වන්නේ ........................................ වර්ගයට අයත් හෝමෝසාපියන් වරු ය.


(18) ශ්‍රී ලංකාවට පැමිණි විජය ඇතුළු පිරිස ගොඩබසින ලද ස්ථානය ........................................ යන නමින් හැඳින්වේ.

(19) මහා වංශයේ සඳහන් වන පරිදි විජයගේ ඇමතිවරුන් විසින් ජනාවාස පිහිටවූයේ ........................................ ඔය ආශ්‍රිතව ය.

(20) ශ්‍රී ලංකාවේ භික්ෂු ශාසනයේ ආරම්භ වන්නේ ........................................ කුමරුගේ පැවිදි වීමත් සමඟ ය.

(ලකුණු 20 x 2 = 40)

පහත ලෝක සිතියම උදවු කරගෙන පිළිතුරු සපයන්න.




(01) (i) ඊජිප්තු ශිෂ්ටාචාරය හා ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පැතිරී ඇති මහද්වීප දැක්වෙන අක්ෂර 02 නම් කරන්න. (ලකුණු 2)

(ii) කොකොසොයිඩ් මානව වර්ගය පැතිරී ගිය මහාද්වීප 02ක් C හා D අක්ෂරවලින් දැක්වේ. එම මහාද්වීප 02 නම් කරන්න. (ලකුණු 2)



(iii) අද ජීවත් වන මානවයාට සම්බන්ධ තවත් දියුණු මානවයෙක් පින්තූරයේ දැක්වේ. මොහු කවු ද? (ලකුණු 1)

(iv) ඔහු කළ කාර්යය 03ක් නම් කරන්න. (ලකුණු 3)



(v) මෙම පින්තූරයේ දැක්වෙන්නේ කුමක් ද? මෙය භවිතා කලේ කුමන ශිෂ්ටාචාරයේ ද? (ලකුණු 2)

(vi) මෙය භාවිතා කළේ කුමන කාර්යයක් සඳහා ද? (ලකුණු 2)



(vii) පින්තූරයේ දැක්වෙන දාගැබ කුමක් ද? (ලකුණු 2)

(viii) මෙම ස්ථූපයේ ඉදි කිරීම අවසන් කළ රජු කවු ද? (ලකුණු 2)

(ලකුණු 2 x 8 = 16)